# අනන්තය



## ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

**ඇත්තට ම සරත් ජෙනරාල් වරයා තමන්ට අනතුරක් නැත්නම් බරක් හැටියට සලකල ඔහුගේ බලවන්ත කමේ හුළං අරින්න මහින්ද වැඩ කළ බව ඕනම පුංචි බබෙකුට වුනත් කල්පනාවෙන් බැලුවහම පෙනෙනව. වෙන හමුදා බලවතුන්ට ශක්තිමත් නිලයන් බාර දෙද්දී ජෙනරාල් සරත් ට අන්තිමට ක්‍රීඩා ලේකම් කම දෙන්න හැදුවේ මේ හින්ද කියල පෙනෙනව. මේ විදියට පියවර ගන්නේ නිකම්ම මේ යුද ජගතා හෑල්ලුවට අරින්න ද නැත්නම් වෙන උවමනාවකට ද? විමල් වීරවංශ දැන් කුමන්ත්‍රණ ගැන උදේ හිටන් රෑ වෙනකන් දොඩවනව. මේ ලෙසට කියන මිනිස්සුම තමා කුමන්ත්‍රණ කරන්නේ. දැන් ගෝලීය බලවතුන්ගේ ඉල්ලීම අනුව යුධ අපරාධ ගැන විමසුමේ දී බිල්ලට දෙන්න කෙනෙක් ආණ්ඩුව හොයනව වත්ද?**

සරත් ෆොන්සේකා ජෙනරාල්වරයා දැන් දේශපාලන පොර පිටියේ චරිතයක් බවට පත් වෙලා. උන්නැහේ කැමති වුනත් නැතත් ආණ්ඩුවේ වගේ ම විපක්ෂයෙත් ධනපති නායකයෝ එයාගේ පිහිටෙන් තම තමන්ගේ දේශපාලනය ඉදිරියට ගෙන යන්න හදනව. පසුගිය කාලයේ ආණ්ඩුව ගෙන ගිය ජාතිවාදී යුධවාදී මර්ධනයේ ලොකුම කෙලිකාරයා හැටියටයි සරත් ෆොන්සේකා ජෙරාල්වරයා සිංහල සමාජය තුළට ඇතුල් වුණේ. ඒ යුද්ධයේ ඇත්ත මෙහෙයුම් කරුවො වහලදාල. එය සිංහල හා දෙමළ වර්ග අතර යුද්ධයක් හැටියට මතු කළේම ආණ්ඩුවේ ගෝරිකාරයො ම තමයි. ඕනෑම කෙනෙක් කල්පනා කළොත් තේරෙනවා නූතන යුගයේ දී ඒ විදියේ වර්ග යුද්ධ නැහැ කියල. අනෙක් අතට හැම නූතන යුද්ධයක්ම ගෝලීය බලවතුන්ගේ අනුදැනුම මත ඇතිවන දේවල් හැටියටත් පැහැදිලිව ම පෙනෙනව. ගෝලීය ධනවාදය අප රට තුළ යුද්ධය දියත් කරන්න, මෙහෙයවන්න වගේම නවත්තන්නත් ක්‍රියා කළා. ඒ ගැන හරි වැරදි හොයන්න කියන්නෙත් උන්මයි. හුඟ දෙනෙක් දන්නේ නෑ මේ පිටිපස්සෙන් ක්‍රියාත්මක වන බලධරයන් ගැන. මහින්ද, ගෝඨාභය, සරත් මේ හැමෝම ගෝලීය බලවතුන්ගේ මංකොල්ල යුද්ධයක් රඟ දක්වපු නාඩගම්කාරයෝ කියල පේන්නේ දැන් දැන් ප්‍රතිඵල පිටවන කොටයි. එදා හෝමර් ග්‍රීක-ට්‍රෝයි යුද්ධය ගැන කියන කොට එය පිටුපස සිටින දෙවිවරුන් ගැන අපට ලස්සනට විස්තර කරනව. ඇත්තටම ඔක්කොම යුද වීරයෝ ඒ කෙළි පෙන්නුවේ දේවතාවියන් හා දෙවිවරුන්ගේ වරයත්, ආනුභාවයත් අනුවයි. ඒ එදා මිනිසා ලෝක බලවේග හඳුනා ගත්ත විදිය. ඒ අනුව එය අවදි වෙමින් එන මිනිසාගේ අද්භූතවාදී චිත්‍රය. මිත්‍යා කතාවක් කියල අපි දරුවන්ට කියල දෙනව. ඒත් අද මේ නූතන යුද්ධ පිටුපස සිටින ගෝලීය බලවතුන් අද්භූතයන් හෝ මිත්‍යාවන් නොවෙයි. පූර්ණ සත්‍යය තියෙන්නේ මේ ගෝලීය බලවතුන්ගේ මැදිහත්වීම් තුළයි.

ඇත්තට ම සරත් ජෙනරාල් වරයා තමන්ට අනතුරක් නැත්නම් බරක් හැටියට සලකල ඔහුගේ බලවන්ත කමේ හුළං අරින්න මහින්ද වැඩ කළ බව ඕනම පුංචි බබෙකුට වුනත් කල්පනාවෙන් බැලුවහම පෙනෙනව. වෙන හමුදා බලවතුන්ට ශක්තිමත් නිලයන් බාර දෙද්දී ජෙනරාල් සරත් ට අන්තිමට ක්‍රීඩා ලේකම් කම දෙන්න හැදුවේ මේ හින්ද කියල පෙනෙනව. මේ විදියට පියවර ගන්නේ නිකම්ම මේ යුද ජගතා හෑල්ලුවට අරින්න ද නැත්නම් වෙන උවමනාවකට ද? විමල් වීරවංශ දැන් කුමන්ත්‍රණ ගැන උදේ හිටන් රෑ වෙනකන් දොඩවනව. මේ ලෙසට කියන මිනිස්සුම තමා කුමන්ත්‍රණ කරන්නේ. දැන් ගෝලීය බලවතුන්ගේ ඉල්ලීම අනුව යුධ අපරාධ ගැන විමසුමේ දී බිල්ලට දෙන්න කෙනෙක් ආණ්ඩුව හොයනව වත්ද? ඒ වගේ සැකයකුත් මතු වෙනව. සරත් නැමැති යුද ජගතා තම බල සීමාවෙන් එළියට අරගෙන සිවිල් මිනිසෙක් හැටියට ක්‍රීඩා කිරීමට තල්ලු කිරීම එවන් සැලසුමක් උඩ කරන දෙයක් ද කියල මට හිතුනා. අනෙක් අතට ඉතිහාසය පුරාම පවතින බලු පොරයක දී එක් බලයක්

තහවුරු කරන්න ඉදිරියට ආපු හමුදා නායකයින් දේශපාලන බලවතුන් බවට පත් වුනා. රෝම යුගයේ ජුලියස් සීසර්, අන්තිමට සීසර් බවට පත් වුනේ හමුදා වීරයෙක් හැටියට පතල වෙලා දේශපාලනයට බැහීමෙන්. නැපෝලියන් දේශපාලනයට ආපු යුධවීරයෙක්. ඒත් අද සීසර්ලගේ නැපෝලියන්ලගේ යුගය නොවෙයි. මට මතකයි එක දවසක් දැන් අවුරුද්දකට විතර ඉස්සෙල්ලා වික්ටර් අයිවන් කත්තුරුවරයා වියන්ගොඩයි මායි එක්කල කෝලාහලයකට ආව මහින්ද නැපෝලියන් කෙනෙක් වෙනව කියල භාගිස්සන්න. මේක විහිළු කතාවක්. අද, සීසර්ලා නැපෝලියන් ලා තියා හිට්ලර්ලවත් බිහි වෙන්න බෑ. ගෝලීය ධනවාදය ඒ සියළු ඉඩකඩ විනාශ කළා. කොහොමටත් ලංකාව වගේ පුංචි රටක ඔය වගේ දේශපාලන නායකයෝ ඇතිවෙන්න අද ඉඩක් නෑ. මහින්ද තියා සරත්ටවත් ලංකාවේ නැපෝලියන් වෙන්න බෑ. නැපෝලියන් ප්‍රංශය පමණක් නොවෙයි යුරෝපයම එකතු කළ නායකයෙක් ලෙසයි එදා ලොව ම හෙල්ලුවේ. මහින්ද ලංකාවේ උතුර නැගෙනහිර තියා රුහුණවත් එකතු කරල සමාජයක් ගොඩ නගල නෑ. මහින්දයි, සරතුයි ගොඩනගල තියෙන්නේ කොයිවෙලේ හරි පුපුරල බිඳ වැටෙන ජාතිවාදී, යුධවාදී පිළුණු වෙච්ච සිහින මාළිගාවක් විතරයි.

ලංකාවේ නැපෝලියන් ගොඩනැගෙනව කොහොම වෙතත්, සිංහල නැපෝලියන්ලා බෙදිලා ගහගන්න පටන් අරන් බවයි අපිට නම් පෙනෙන්නේ. මොකද සිංහල නැපෝලියන් ටයිටල් එකට පොරකන අය ගොඩක් ඉන්නව. මහින්ද, ජෙනරල් සරත්, හිටපු විනිසුරු සරත්, මංගල, විමල්, සෝමවංශ, රනිල්. මේ විදියට, එක එක මාදිලියෙන් මේ අය සැලසුම් දමල තියෙන බව කියන කථා වලින් පෙනෙනව. මහින්දට දැන් යැංකි මන්කි සහයෝගය තිබෙන බව පැහැදිලියි. ඉංදියාවේ අධිරාජිනියත්, මන්මෝහන් ඇතුළු බමුණු පුරෝහිතයොත් එකතු වෙලායි දෙමළ නියෝජිත පිරිසක් ලංකාවට එව්වේ කියල දැන් දෙමළ ජනතාවට නම් පැහැදිලියි. ඒ සෝනියා මහ රැජිනගේ නියෝජිතයෝ ආවේ ආණ්ඩුවට තිබෙන අපවාදවලට මුහුණ දීම සඳහා මහින්දගේ හිත දිරිමත් කරන්නට. වේදනාවෙන් හැකුෂු දෙමළ ජනතාව මේ වන කොට දන්නව ඉංදියාව තමන්ට සෙත සලස්සනවා වෙනුවට දෙමළ නිජබිම සුන් කරන්නට බලන් ඉන්න බලවතෙක් කියල. දැන් ඒක තේරෙනව. දකුණු ඉංදීය කොටි නියෝජිතයෝ ආවත් වෙනම කෑගහගෙන ඉස්සරහට පනින්නට ඔවුන්ට උවමනා වුනේ නෑ. ඔක්කෝමල මහින්දට රත්තරන් සළුවක් පොරවල ගුණ වර්ණනා කරලයි ගියේ. සෝනියා මහා රාජිනියගේ නියෝජිතයෝ මහින්දට දැනුම් දීල තියෙන්නේ දැන් නැවත පදිංචි කිරීම් ආරම්භ කළාට කමක් නෑ කියලයි. ඒ අනුව මහින්ද ගලවා ගැනීමේ වැඩ පිළිවෙලක් තමා ඉංදීය මහා රාණීත්, දිල්ලි බමුණොත් සැලසුම් කරල තියෙන්නේ. මහින්ද රජය කොහොමටත් බේරාගෙන පහල නිලධාරීන්ට වරද පැටවීමට මහ රාණීත් එකඟ වෙලා වගෙයි පෙනෙන්නේ. සිංහල නැපෝලියන් සෝනියා දේවියගේ ඇබිත්තයෙක් හැටියටයි ඉතිහාසය නියම කරල තියෙන්නේ.

අපේ වගේ රටවල් වල ධනපති පංතිය ප්‍රබුද්ධ නැති නිසා ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිලිවෙලක් දියත් කර ගන්නත් හැකියාව නෑ. ගෝලීය බලවතුන්ට වහල් වෙනව විතරක් නෙමෙයි, දේශීය පැරණි වහල් රාමු වලටත් යට වෙලයි ඔවුන් ඉන්නේ. උදාහරණයක් හැටියට ඊනියා දේශීය ධනපතියන් ඉතාම කුලවාදී යි. විශේෂයෙන් ම දකුණේ ධනපතියන් තදින් කුල වලට බෙදිල ඉන්න බවයි පෙනෙන්නේ. මේ නිසා යුද්ධෙදී එකතු වුනත්, ගොයිගම රාජපක්ෂලා ලොකු තානාන්තර දීල ජාතික වීරයෝ පට්ටම් ෆොන්සේකලාට, සිල්වලාට, ප්‍රනාන්දුලාට පූජාකරල සැනසෙයි කියල හිතන්න අමාරුයි. අනිත් එක ජාතිවාදියා, ආගම්වාදයට වගේම ප්‍රදේශවාදයටත්, අන්තිමට කුලවාදයටත් යන එක නවත්වන්න බෑ. ඉස්සර හමුදාවේ කොබ්බෑකඩුවලා, පානබොක්කේලා හිටියට දැන් ඇත්ත ලේ වැගිරීමට ඉදිරිපත් වෙලා තියෙන්නේ ෆොන්සේකලා, සිල්වලා ප්‍රනාන්දුලා වගෙයි නම් ලැයිස්තු බැලුවහම පේන්නේ. කුලවාදීන්ට මේකත් ගැටළුවක් වෙනවාට කිසිම සැකයක් නෑ. බෙදුම්වාදයට විරුද්ධව දෙමළ කොල්ලයට ගිය සිංහ ධනපති පැලැන්තිය දැන් උන් අතරම බෙදුම්වාදය උග්‍ර කරගෙන තව තවත් යැංකි මංකි බලවතුන් ඉදිරියේ භක්‍ෂා වැලපෙන හැටි අපට ඉදිරියේදී බලා ගන්න පුළුවන් වේවි. මේ අතර පහළ සොල්දාදුවෝ දැන් කාකි වහළුන් හැටියට කොම්පැණි වලට

කුලියට විකුණන තැනට වැටිලා. බෝනස්, බටා සහන කපලා කාකි කුලී කරුවන් හැටියට උන්ව පරදේසක්කාරයන්ට වාල් වැඩට දමන්න පටන් අරන්. මේක තමයි පංති සටනේ ගින්න හමුදාවට ඇතුල් වෙන තැන.

KJL
ශ්‍රී ලාංකික ඔබේ සියලු අවශ්‍යතා සඳහා
SPICE CORNER
Monday - Thursday 10.30am to 8.00pm
Friday - 10.30am to 9.00pm
Saturday - 10.30am to 9.00pm
Sunday - 10.30am to 8.00pm
ශීත කළ ආහාර
රසකැවිලි
හාල්
තුන පහ වර්ග
වීඩියෝ ඩීවීඩී සීඩී
හින්දි සිංහල චිත්‍රපට
ඉන්දියානු ශ්‍රී ලංකා සාරි සහ බ්ලවුස්
මැණික් හා ස්වර්ණාභරණ
ෆෝන් කාඩ්ස්
වෙසක් සුබපැතුම් පත්
දිනපතා උණු උණු ආහාර
බුරියානි
බත්
පෑන් රෝල්ස්
වඩේ
weekly video hire 75c
වීඩියෝ ඔබටම අයිති කරගන්න ඩොලර් 1
16 Bellerive Avenue Mount Waverley
Tel : 9544 7189 Mob 0418 351 620 Fax : 9562 5503

**ESRS Mathematics and Physics Tutoring**

**Quality tutoring for primary, secondary and VCE students conducted by experienced University Lecturers!**
Bookings for 2010 are Open Now!
Attend Summer Vacation Classes and get ahead of School!
Our Past Students have obtained ***ENTER scores up to 99.4!***

ESRS Rates (Individual Regular Classes):
Primary $30/hr, Secondary $35/hr & VCE $35-$40/hr

For further details visit ESRS website at:
http://esrs.vic.googlepages.com/

**Contacts:**
Dr. Chandra Athaudage [PhD(RMIT), MSc(Japan), BScEng(Hons)]
Mrs. Priyantha Nandasena [MEngSc(Monash), MSc, BScEng(Hons)]
Tel: (03) 9795-5070 Mobile: 0422001605
Email: c.athaudage@gmail.com or pri.nandasena@gmail.com